## සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනය- 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

**ගිණුම්කරණ අඩුපාඩු**

විගණනයේදී පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) එකතුව රු.39,226,933 ක් වූ ස්ථාවර වත්කම් භෞතික පරීක්ෂණය මත පදනම් කර ගත් අගය වෙනුවට පොත් අගය මත පදනම්ව ගිණුම්ගත කර තිබුණි. .

(ආ) ස්වාමි විපුලානන්ද සංගීත හා නැටුම් විද්‍යාලයේ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම ප්‍රත්‍යාගණනය කර ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වල ගිණුම්ගත කර නොතිබුණි.

### 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , සමාලෝචිත වර්ෂයේ ආයතනයේ වැඩ කටයුතු වලින් වූ ප්‍රතිඵලය රු.57,500,000 ක් වූ පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ප්‍රදානය සැලකිල්ලට ගැනීමෙන් පසු රු.3,573,872 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ රු.42,314,778 ක රජයේ ප්‍රදානය සැලකිල්ලට ගැනීමෙන් පසු එම වර්ෂයේ රු.1,934,894 ක ඌනතාවයක් වුයෙන් රු.5,508,766 කින් මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් දැක්වුණි. පුනරාවර්තන ප්‍රදානය වැඩිවීම එයට හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) විභාග ප්‍රතිඵල**

ලබාගත හැකි වු තොරතුරු අනුව පවත්වන ලද විභාග වලදී උපාධි ලාභීන්ගේ කාර්ය සාධනය පහත දැක්වේ.

| පීඨය | විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමර්ථ වු ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| සංගීත | 45 | 44 |
| නැටුම් | 56 | 54 |
| නාට්‍ය හා රංගන | 90 | 82 |
| දෘශ්‍ය හා තාක්ෂණික කලාව | 06 | 06 |
| එකතුව | 197 | 186 |

**(ආ) ඒක ශිෂ්‍ය පිරිවැය**

ආයතනයේ පාඨමාලා 4 ක් සඳහා ලියාපදිංචි වු මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 796 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ දරන ලද මුළු පුනරාවර්තන වියදම රු. 54,285,237 ක් වු අතර සමාලෝචිත වර්ෂය සඳහා ඒක ශිෂ්‍ය සාමාන්‍ය පුනරාවර්තන පිරිවැය රු.68,198 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ඒක ශිෂ්‍ය පිරිවැය රු.8,334 කින් වැඩිවී තිබුණි.

**(ඇ) මහපොළ සහ ශිෂ්‍යාධාර**

සමාලෝචිත වර්ෂය තුළදී ශිෂ්‍යයින් 583 ක් සඳහා ශිෂ්‍යාධාර ලෙස රු.7,825,200 ක්ද ශිෂ්‍යයින් 55 ක් සඳහා මහපොළ ආධාර ලෙස රු.472,500 ක්ද ගෙවා තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පසු ගිය වර්ෂය තුළ විවිධ සැපයුම්කරුවන් නමින් ලියන ලද රු.3,622,315 ක්වූ චෙක්පත් 14 ක් ආයතනයේ නිලධාරියකු විසින් මඩකලපුවේ පුද්ගලික බැංකු ශාඛාවක පවත්වාගෙන යන ඔහුගේ බැංකු ගිණුම මගින් වංචනිකව මුදල් කර ගෙන තිබුණි.

(ආ) බිම කාපට් , චිත්‍රාධාර ( easels ) , මුර්ති චක්‍ර ( Sculpture Wheels ) සහ බන්ක් බෙඩ්ස් (Bunk beds ) රු.4,183,728 ක පිරිවැයකට පසුගිය වර්ෂය තුළ ආයතනය විසින් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බිම කාපට් වර්ග අඩියකට රු.480 බැගින් පවතින වෙළඳපොළ මිලට වඩා ඉහල රේටයකට ගෙවා තිබුණි. කෙසේ වුවද මඩකලපව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මෙයට සමාන වර්ගයේ කාපට් වර්ග අඩියක් රු.60 බැගින් මිලදී ගෙන තිබුණි.

(ii) තෝරාගත් සැපයුම්කරුවන් 7 දෙනෙකුට ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාර විසින් ටෙන්ඩර් ලියකියවිලි යවා තිබුණද කාත්තන්කුඩි හි වු එයින් එක් සැපයුම්කරුවකු ව්‍යාජ නමකින් වු අතර දෙවැන සැපයුම් කාර ස්ථානය වාහන සේවා මධ්‍යස්ථානයක් හා වෙල්ඩින් ගරාජයක් විය. මඩකලපුවෙහි තවත් සැපයුම්කාර ස්ථානයක් වෙල්ඩින් වැඩපොළක් විය.

(iii) චිත්‍රාධාර ( easels ) 70 ක් එකක් රු.14,000 බැගින් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද සැපයුම්කරුගෙන් ලබාගත් ප්‍රකාශයට අනුව පවතින වෙළඳපොළ වටිනාකම එකක් රු.7,000 ක් විය. මේ සම්බන්ධයෙන් රු.490,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(iv) පරිසර නිලධාර, ප්‍රාදේශීය ලේකම් හා අරියම්පති ප්‍රාදේශීය සභා වාර්තාවන්ට අනුව චිත්‍රාධාර මිලදී ගනු ලැබු ස්ථානය වෙල්ඩින් ගරාජයක් විය.

(v) ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාර විසිත් තෝරාගත් සැපයුම්කරුවන් 7 දෙනකුට ටෙන්ඩර් ලියකියවිලි යවා තිබුණද , පළාත් පාලන ආයතනයේ ආදායම් පරික්ෂක සමඟ කරන ලද සෘජු පරික්ෂාවට අනුව ලංසුකරුවන් 5 දෙනෙකු වෙල්ඩින් වැඩපොළවල් වු අතර එක් වෙල්ඩින් වැඩපොළක කිසිඳු ලී භාණ්ඩයක් නිෂ්පාදනය කර නොතිබුණි.

(vi) 2008 වර්ෂයේදී වසා දමන ලද මොරටුවේ පුද්ගලික වෙළඳ සැලකින් රු.1,230,000 කට "බන්ක් බෙඩ්ස් " 30 ක් මිලදී ගෙන තිබුණු අතර වර්ෂ දෙකකට වැඩි කාලයක්

නව ව්‍යාපාර ආයතනයක් ( රෙදි සම්බන්ධ ) එම ලිපිනයේ ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

(vii) "බන්ක් බෙඩ්ස් " මිලදී ගැනීම සනාථ කිරීම සඳහා ව්‍යාජ බිල්පත් භාවිතා කර තිබුණි.

(viii) එකක් රු. 41,000 බැගින් "බන්ක් බෙඩ්ස් " 30 මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද සැපයුම්කරුගෙන් ලබාගත් ප්‍රකාශයට අනුව පවතින වෙළඳපල වටිනාකම රු.30,000 ක් පමණක් විය. මේ සම්බන්ධයෙන් රු.330,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ix) මූර්ති චක්‍ර මිලදී ගැනීම සඳහා විවිධ පිරිවිතරයන් සැපයුම්කරුවන්ට යවා තිබුණි.

(x) සැපයුම්කරු විසින් එකක් රු.21,500 ක් වූ ඉහළ රේටයකට මූර්ති චක්‍ර සපයා තිබුණි. එහෙත් මූර්ති චක්‍ර එකක පවත්නා වෙළඳපොළ වටිනාකම රු.10,000 ක් විය. මේ සම්බන්ධයෙන් රු.575,000 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) ආයතනය විසින් තථ්‍ය අවශ්‍යතාවය හා අව්‍යාජත්වය සැලකිල්ලට ගැනමෙන් තොරව රු.මිලියන 1.27 ක පිරිවැයකට ව්‍යාජ / අනුරූප ටෝනර් 91 ක් මිලදී ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එම ටෝනර් වර්ෂ 1 කට වැඩි කාලයක් ආයතනයේ ගබඩාවේ නිෂ්කාර්යව තිබුණි.

(ඈ) මිලදී ගන්නා ලද පහත දැක්වෙන පාරිභෝජ්‍ය විෂයයන් උපයෝජනය කිරීමෙන් තොරව ගබඩාවේ තබා තිබුණි.

| විෂයය | ප්‍රමාණය |
|---|---|
| ---------- | ---------- |
| මදුරු දඟර | පැකට් 465 |
| ලයිසෝල් | බෝතල් 662 |
| හාපික් | බෝතල් 944 |
| හැන්ඩ් වොෂ් | බෝතල් 107 |
| මදුරු දියර නැවත පිරවීම් ( Mosquito liquid refill ) | බෝතල් 90 |
| එයාර් ෆ්‍රෙෂ්නර් | බෝතල් 124 |
| DVD ඩිස්ක් | සංඛ්‍යාව 900 |
| VCD ඩිස්ක් | සංඛ්‍යාව 309 |

(ඉ) 2009 / 2010 වර්ෂය සඳහා කරන ලද භාණ්ඩ සමීක්ෂණයේදී වටිනා සංගීත හා නැටුම් උපකරණ 102 ක සංඛ්‍යාවක ඌනතාවයක් වාර්තා වී තිබුණි. කෙසේ වුවද ඌනතාවයන්

සඳහා වගකීම පැවරීමට හා පාඩු අයකර ගැනීමට විධිමත්ව කටයුතු කිරීමට කළමනාකරණය විසින් පියවර ගෙන නොතිබුණි.

**4. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය**

**4.1 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම**

2010 - 2015 කාල පරිච්ඡේදය සඳහා ආයතනය විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව එහි ප්‍රමාණවත් තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

**4.2 අයවැය ලේඛනමය පාලනය**

අයවැය ගත වියදම හා තථ්‍ය වියදම අතර විශාල විචලනයන් නිරීක්ෂණය වුයෙන් , අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) වත්කම් කළමනාකරණය

(ආ) ප්‍රසම්පාදන

(ඇ) මුල්‍ය කළමනාකරණය